# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## දුටුගැමුණු-537 A



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 537 A - දුටුගැමුණු

# ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

ටී.එස්.එන්.ඒ.දේවසුරේන්ද්‍ර මිය

# පටුන

1. දුටුගැමුණු වසමේ පිහිටීම හා සාමාජීය සංස්කෘතික කරුණු 01

2. සිතියම 02

3. යටිතල පහසුකම් සඳහා සැලැස්ම.

I ඉදිකිරීම් 03
II මාර්ග 03
III කානු 04

4. සමාජ සංවර්ධන සඳහා වන සැලැස්ම.

I නිවාස 05

II සෞඛ්‍ය 05

III වැඩිහිටි ප්‍රජාව 06

IV මත්ද්‍රව්‍ය 06

V සනීපාරක්ෂාව 07

VI ආගමික ස්ථාන 07

VII අධ්‍යාපනය 08

VIII ළමා අපයෝජනය 09

5. නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම. 10

6. ජීවනෝපාය, ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබලකරණ සැලැස්ම. 11

7. පරිසර කළමනාකරණ සැලැස්ම 12

I ඩෙංගු උවදුර 13

8. කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම. 14

## 01.දුටුගැමුණු වසමේ පිහිටීම හා සාමාජීය සංස්කෘතික තොරතුරු

කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 මෙන් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් දෙහිවල වන අතර එහි ඇති ග්‍රාම නිලධාරි වසම් 15 පිහිටා ඇත. ඒ අතරින් ''දුටුගැමුණු වසම 537-A'' පිහිටා ඇත්තේ නාගරික පරිසරයකය. මෙහි සිංහල, දෙමළ, මුස්ලිම්, වෙනත් ජාතීන්ට අයත් ජනතාව ජීවත් වේ. මෙම වසමේ පිහිටීම ගත් කල කළුබෝවිල රෝහල අවසාන වන ස්ථානයේ සුනන්දාරාම මාර්ගයේ සිට නුගේගොඩ දෙමළ විද්‍යාලය දක්වා ද අනුලා විද්‍යාලයේ ඉදිරිපස කොටස දක්වා ද විහිදේ. නැවත ඇන්ඩර්සන් මාර්ගයේ වම් පස සිට විජයමංගලාරාම මාර්ගය තෙක් ද කොහුවල මංසන්ධිය දක්වා ද පිහිටා ඇත.

මෙම වසමට පැමිණීම සඳහා 163, 183, 139, 176, 120 බස් රථ මගින් පැමිණිය හැකිය. කළුබෝවිල, කොහුවල, නුගේගොඩ යන ප්‍රධාන නගර තුනකට මැදිව පිහිටා ඇත. මෙහි ප්‍රධාන මාර්ග හා අතුරු මාර්ග වශයෙන් මාර්ග 19 දැකගත හැක.

1. ආතර් පෙදෙස
2. ඇන්ඩර්සන් පාර
3. එඩ්වඩ් පෙදෙස
4. එස්. ද එස්. ජයසිංහ පාර
5. කාශ්‍යප මාවත
6. ගර්ටල් පාසල් පාර
7. ග්‍රීන් පාත් පාර
8. දුටුගැමුණු වීදිය
9. පරාක්‍රම මාවත (එස්. ද එස්. ජයසිංහ පාර)
10. සුනන්දාරාම පාර
11. සිරිගල් මාවත
12. සුනේත්‍රා දේවි පාර
13. විජයමංගලාරාම පාර
14. පීටර් පෙදෙස
15. මුදලි මාවත
16. රේමන් පාර
17. හයිලෙවල් පාර
18. පෙරේරා මාවත
19. ඉන්ද්‍රා මාවත

මම වසමේ රාජ්‍ය ආයතන ගත් කල

- ⋆ කොහුවල පොලිසිය 0112853621
- ⋆ උපතැපැල් කාර්යාලය 0114948943
- ⋆ සී/ස දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමිතිය - 0112826141/ 0112852461
- ⋆ ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- ⋆නිසල අරණ සුසාන භූමිය - 0112803410/0112853403
- ⋆ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය -
- ⋆ මහජන බැංකුව
- ⋆ රාජ්‍ය ඔසුසල - 0112856641

පෞද්ගලික අංශයේ ආයතන ද දුටුගැමුණු වසම තුළ පිහිටා ඇත.

- ⋆ Saegis Campus
- ⋆ ලයිසියම් ජාත්‍යන්තර විද්‍යාලය
- ⋆ කොමර්ෂල් බැංකුව
- ⋆ කලම්බු සවුත් ජාත්‍යන්තර පාසල
- ⋆ සම්පත් බැංකුව
- ⋆ පෑන් ඒෂියා බැංකුව

ආදී වශයෙන් වසමේ පිහිටා ඇත. තව ද විහාරස්ථාන, කතෝලික සභාව, කෝවිල වසම තුළ පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ ජනතාව අතර අන්‍යෝන්‍ය සහ සම්බන්ධතාවක් දැකගත නොහැක. එයට හේතුව වී ඇත්තේ අධි නාගරික ප්‍රදේශයක් වන මේ ප්‍රදේශයේ එක් එක් පළාත්වලින් පැමිණ ජීවත් වන පිරිස් වීමයි.

පිහිටීම :- උතුරින් හා ඊසාන දිගින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත් නගෙනහිර හා ගිනිකොණ දිශාවෙන් කොහුවල හා නැදිමාල ග්‍රාමනිලධාරී වසම් වලින් ද දකුණ, නිරිත දිගින් හා බස්නාහිරින් කළුබෝවිල ග්‍රාමනිලධාරී වසමින් ද වයඹ දිශාවෙන් කොළඹ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යල දෙසට ද විහිදී පිහිටා ඇත.

ජනවර්ගය අනුව ගමේ ජනගහනය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සිංහල | 3952 | ලංකා දෙමළ | 326 | යෝනක | 1678 | වෙනත් | 89 | එකතුව | 6045 |


ආගම අනුව ගමේ ජනගහනය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෞද්ධ | 3684 | හින්දු | 255 | මුස්ලිම් | 1678 | ක්‍රිස්ත්‍රියානි | 368 | වෙනත් | 60 | එකතුව | 6045 |

ජනවර්ගය අනුව ගමේ නිවාස සංඛ්‍යාව

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිංහල | 730 | දෙමළ | 40 | මුස්ලිම් | 242 | ක්‍රිස්තියානි | 62 | වෙනත් | 20 | එකතුව | 1094 |

**02.වසමේ සිතියම**



## 03.යටිතල පහසුකම් සඳහා සංවර්ධන සැලැස්ම

* යටිතල පහසුකම් සංවර්ධනය :-

දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසම් 15 අතරින් දුටුගැමුණු වසමේ යටිතල පහසුකම් ගත්කල ජලය, විදුලිය, නිවාස, මාවත්, කාණු පද්ධතිය හොඳ මට්ටමක පවතී. නමුත් මෙහි ප්‍රධානම අවශ්‍යතා රාශියක් ඉටුවන ග්‍රාමනිලධාරී කාර්යාලයක් පිහිටා නොමැත. මිනිසුන්ගේ රාජකාරි ඉටුකර ගැනීමේ දී බොහෝ අපහසුතාවලට ලක්වීමට සිදුව ඇත. භූමියක් පැවතුන ද යම් යම් හේතු සාධක මත සේවකයාට හා සේවා ලාභියාට පැමිණීමට හා සේවය ලබා ගැනීමට "**සේවා පියසක**" විශාල අඩුවක් දුටුගැමුණු වසම තුළ ඇත.

### i ඉදිකිරීම්

| | |
|---|---|
| ගැටලුව :- | රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රාජකාරි ඉටුකරලීමේ ස්ථානයක් නොමැතිකම හා මහජනතාවගේ රාජකාරි කටයුතු ඉටුකර ගැනීමේ දී ඇති වන අපහසුතා හා වැය වන ¡කලය අධික වීම. |
| අරමුණ :- | i. රාජ්‍ය නිලධාරීන්ට හා සේවා ලාභීන්ට එකම ස්ථානයක පහසුකම් සැලැස්වීම.<br>ii. කෙටි කාලයකින් අඩු වියදමකින් සේවා සැපයීමට ඉඩ සැලැස්වීම.<br>iii. ක්ෂේත්‍ර ගත නිලධාරීන් එකම ස්ථානයේ රැඳී සිටීමෙන් රාජකාරි රැසක් එකම ස්ථානයේ දී එකම වේලාවක දී මහජනතාවට ඉටුකර ගැනීමට සැලැස්වීම. |
| උපාය මාර්ග :- | දැනට නගර සභාව සතුව පවතින ඉඩමේ දෙහි/ගල් මහ නගරසභා නිලධාරීන් හා දේශපාලන අධිකාරිය සමඟ සාකච්ඡා කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යෝජනාව යොමු කොට ප්‍රතිපාදන ලබා ගැනීම. |
| ක්‍රියාකාරකම් | i. සිරිගල් මාවතේ පෙර තිබූ ස්ථානයේ ග්‍රාමනිලධාරි කාර්යාලය වෙනුවට "**සේවා පියස**" ඉදිකිරීම.<br>ii. සියලු ම ක්ෂේත්‍ර ගත රාජ්‍ය නිලධාරීන්ට පහසුකම් සහිත සේවා පියස මඟින් රාජකාරි ඉටුකර දීමට පහසුකම් සැලැස්වීම.<br>iii. ක්ෂේත්‍ර නිලධාරීන් එකම දිනක රාජකාරි ඉටුකර දීමෙන් කාර්යක්ෂම කඩිනම් සේවාවක් මහජනතාවට සැලැස්වීම. |
| කාලය | මාස 06 |
| ප්‍රතිලාභීන් | පවුල් - 4763 |
| වගකීම | දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

ii **මාර්ග** :- දුටුගැමුණු වසමේ මාර්ග හොඳ මට්ටමේ පවතින අතර, මෙහි ඇති ප්‍රධානම ගැටලුව මාර්ග තදබදයයි. අවට ගම්වාසීන් හට ගමනාගමනයේ දී බොහෝ කාලයක් මාර්ගයේ ගත කිරීමට සිදුව ඇත. ගුවන් පාලම් ඉදිකිරීම හා මාර්ග පුළුල් කිරීම ඉතා කඩිනමින් සිදුවිය යුතුය.

| | |
|---|---|
| ගැටලුව | ✶ ප්‍රධාන මාර්ගයේ ඇති වාහන තදබදය.<br>✶ මාර්ග අබලන් වීම නිසා වැය වන කාලය අධික වීම හා නියමිත වේලාවට ගමනාන්තයට අපහසු වීම. මාර්ගයේ ගමන් ගන්නා රථවාහනවල ඇති වන දෝෂ හා අනතුරු බහුල වීම. |
| අරමුණ | ✶ විකල්ප මාර්ග හඳුන්වාදීම හා මාර්ග පළල් කිරීම.<br>i. නියමිත ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් ලබා දීම.<br>ii. රථවාහන අනතුරු හා මඟී අනතුරු අවම කිරීම.<br>iii. පදිකයින් සඳහා පහසුවෙන් ගමන් කළ හැකි මාර්ගයක් ලබා දීම. |
| උපාය මාර්ගය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ දෙහි/ගල් මහනගර සභා තාක්ෂණ නිලධාරී, ප්‍රධාන නාගරික ඉංජිනේරු පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී, නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී හා සැලසුම් අංශයේ අදහස් ද එක්ව කටයුතු කිරීම. |
| ක්‍රියාකාරකම | ✶ අතුරු මාර්ග භාවිතයෙන් තදබදය අවම කිරීමට විකල්ප මාර්ග පුළුල් කිරීම<br>✶ කොහුවල මංසන්ධියේ සිට නුගේගොඩ අවසන් විදුලි ආලෝක කණු දක්වා ගුවන් පාලමක් ඉදිකිරීම. |

| | |
|---|---|
| | i. සුනන්දාරාම පාර නොඃ 23 සිට 23/2 දක්වා පාර කොන්ක්‍රීට් කිරීම හා වැසි ජලය එකතුවීම සඳහා ගලි (03) තුනක් සවි කිරීම. (මෙහි දැනට ගලි 02 සවිකර ඇත.) සුළු වර්ෂාවකදී නිවෙස් තුලට වැසිජලය ගලා ගෙන යාම සිදුවෙයි. මාර්ගයේ ජනතාවට උපදෙස් ලැබී ඇත්තේ ගලි 3 නැවත සවි කිරීමෙන් මෙම ගැටලුව මතු නොවන බවයි.<br>ii. ඇන්ඩර්සන් පාරේ මැක්සීස් එක අසල පාර නොඃ 28 සිට අවසානය දක්වා කොන්ක්‍රීට් කිරීම පළල අඩි 10 දිග 60 m.<br>* ඍජු ප්‍රතිලාභීන් - 40 වක්‍ර ප්‍රතිලාභීන් 80<br>iii. ඇස්. ඩී. ඇස්. ජයසිංහ පාරේ නොඃ 51 සිට 51/C දක්වා තාර දැමීම පළල අඩි 10 දිග 50 ක්. (මෙහි කොටසක් තාර දමා හොඳ තත්වයේ ඇත).<br>* ඍජු ප්‍රතිලාභීන් - 80 * වක්‍ර ප්‍රතිලාභීන් 160<br>iv. චින්තාරාමය පාර ආරම්භයේ සිට 143/2 දක්වා පාර කාපට් කිරීම (අඩි 12 පමණ පළල දිග 50 මීටර් පමණ).<br>v. චින්තාරාම පාරේ 143/2 සිට පාලම දක්වා පාර තාර දැමීම. (අඩි 10 පමණ පළල දිග 40 මීටර් පමණ)<br>vi. ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානයේ වැසි ජලයෙන් යට වන ගොඩනැගිලි සුරක්ෂිත කරගැනීම සඳහා එම ජලය ඉදිරිපස කාණුවට රැගෙන ඒමට ගැඹුරු කාණුවක් හරහා අඟල් 6 ක බටයකින් වැසි ජලය ඉවත් කර ගැනීම. |
| කාලය | මාස 03 යි |
| වගකීම | දෙහි/ගල් මහනගර සභාව, පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙහිවල. |

**iii.කාණු** :- දුටුගැමුණු වසමේ ප්‍රධාන මාර්ග වල කාණු පද්ධතිය හොඳ මට්ටමක පවතී. අතුරු මාර්ග වල සපත්තු පාලම් හා කාණු ජලය ගලා බැස යාමට ඉදිකර ඇත. නාගරික ප්‍රදේශයක පිහිටි දුටුගැමුණු වසමේ කාණු පද්ධතිය අදාල ආයතන මඟින් හොඳ මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ. මෙම වසමේ කාණු අතර ඉන්ද්‍රා මාවතේහි නො : 21/1 පටන් ගන්නා නිවාස සියල්ල කුඩා වර්ෂාවකට උවද මාර්ගය හා නිවාස ජලයෙන් යටවේ. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම මාර්ගයේ ජලය බැසයාමට ඇති ඉන්ද්‍රා මාවතේ කාණුව ''ගැඹුරු'' නොවීමයි. එයින් මෙහි ජීවත් වන නිවාස 10 පුද්ගලයින් හට විශාල පරිසර ගැටලුවක් ඇති වේ.

| | |
|---|---|
| ගැටලුව | ✶ වර්ෂා කාලයේ දී ජලයෙන් කාණු යටවීම නිසා කාණු අවහිර වී නො. 21/1 සිට 21/8 දක්වා නිවාස සියල්ල ජලයෙන් යටවීම.<br>✶ වර්ෂා කාලයේ දී කාණු ජලයෙන් පිරී ඉතිරී යාම. |
| අරමුණු | ✶ වර්ෂා ජලය විධිමත්ව බැස යන ලෙස කාණු ගැඹුරු කර ඉදිකිරීම මඟින් ජලයෙන් යටවීම වැළැක්වීම.<br>✶ වැලි හා අපද්‍රව්‍ය පිරී ඇති කාණු පිරිසිදු කිරීම මඟින් ජලය බැස යන කාණු පද්ධතියක් බවට පත් කිරීම. |
| උපාය මාර්ගය | ප්‍රා. ලේ. කා. හා දෙහි/ගල් මහ නගර සභා තාක්ෂණ නිලධාරි හා ප්‍රධාන නාගරික ඉංජිනේරු, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි, නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි හා සැලසුම් අංශයේ අදහස් ද එකගව කටයුතු කිරීම. |
| ක්‍රියාකාරකම් | i. ඉන්ද්‍රා මාවතේ ප්‍රධාන කාණුව ගැඹුරු කර නො 21/1 නිවාස කරා ගලා යන වැසි ජලය ප්‍රධාන කාණුවට ගලා බසින ලෙස ප්‍රධාන කාණුව ද ගැඹුරු කිරීමෙන් වතුර එක්රොක් වී නො 21/1 නිවාස ජලයෙන් යටවීම වැළැක්වීම.<br>* තාක්ෂණ උපදෙස් පරිදි කාණු පද්ධතිය සකස් කිරීම.<br>ii. චින්තාරාම පාරේ නො. 143/2 නිවාස ආරම්භයේ සිට බෝක්කුව දක්වා ඇති අඩි 3 පළල මීටර් 30 පමණ කාණුව ඉදිකිරීම අවසානයේ ඇති පාලම දෙපසට ඇදි දෙකක් බැඳීම. |
| කාලය | මාස 06 |
| ප්‍රතිලාභීන් | පවුල් - 10 |
| වගකීම | දෙහි/ගල් මහනගර සභාව හා ග්‍රාම සංවර්ධන සමිතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |

04.**සමාජ සංවර්ධනය සඳහා වන සැලැස්ම**

සමාජ සංවර්ධනය ගත්කල සෑම අයෙකුට ම බිම් අඟලක් නිවහනක් ලබාදීම සමාජ සංවර්ධනයේ එක් අංගයකි. තව ද ජනතාවගේ ආකල්ප, සිරිත් විරිත්, භාෂාව දියුණු කිරීම ද සමාජ සංවර්ධනයට තවත් කොටසකි. එසේ ම සනීපාරක්ෂාව, මත්ද්‍රව්‍ය, වැඩිහිටි ප්‍රජාව, සෞඛ්‍ය, ජලය, විදුලිය, ආගම, සංස්කෘතිය යන කරුණු ද සමාජ සංවර්ධනයේ කොටස්ය. මීට අමතරව ද බොහෝ පැතිකඩවල් සමාජ සංවර්ධනයේ දී ගත හැක.

**i.නිවාස** :- දුටුගැමුණු වසම ඉතා සංවර්ධිත ප්‍රදේශයක් වන අතර මෙහි ජීවත් වන ප්‍රජාවගෙන් බොහෝ පිරිසක් ආර්ථික මට්ටමින් ඉහළ තත්වයක අයය. මෙහි දියුණු වෙමින් පවතින පවුල් කිහිපයකි. ඔවුන්ගේ නිවාස නුසුදුසු තත්වයේ පවතී. එවැනි නිවාස ඉන්ද්‍රා මාවතේ හා පරණ සිරිගල් මාවතෙහි හා මුදලි මාවතේ පිහිටා ඇත. මොවුන්ගේ ආකල්ප හා ජීවන රටාවේ පැවැත්ම මත නිවසක් ඉදිකර ගැනීමට නොහැකි වී ඇත. තව ද මෙම නිවාස ඉදිකර ඇති අවිධිමත් බාවය බොහෝ ගැටලුවක් වී ඇත.

| | |
|---|---|
| ගැටලුව | අවිධිමත් නිවාස ඉදිකිරීම මත ඇති වන පාරිසරික හා සමාජීය ගැටලු ඇති වීම. |
| අරමුණ | අවිධිමත් ඉදිකිරීම් අවම කිරීම හා විධිමත් සැලැස්මකට ඉදිකිරීම් කිරීම. |
| උපාය මාර්ග | විධිමත් සැලැස්මක් සකස් කිරීම. පරිසරයට අවම බාධාවක් ඇති වන ආකාරයට ස්ථානය තෝරා දීර්ඝ කාලීන සැලැස්මකට අනුව හරිත සංකල්පය යටතේ සැලැස්ම සකස් කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ අඩු භූමි ප්‍රමාණයෙන් වැඩි නිවාස ප්‍රමාණයක් ලබා දීම.<br>✶ මහල් නිවාස ක්‍රමයක් ඉදිකර දීම. (සිරිගල් මාවත, ඉන්ද්‍රා මාවත, මුදලි මාවත යන ස්ථාන තුනෙහි. එම භූමියට ගැළපෙන සේ මහල් නිවාස ඉදිකිරීම).<br>✶ මූලික පහසුකම් ප්‍රතිලාභීන්ට ලැබීමට සැලැස්වීම. (ළමා උද්‍යාන/ ක්‍රීඩා කිරීමේ ස්ථාන) |
| කාලය | වසර 04 යි |
| ප්‍රතිලාභීන් | පවුල් 75 |
| වගකීම | ✶ නිවාස සංවර්ධන අධිකාරිය (නිවාස සංවර්ධන නිලධාරි)<br>✶ දෙහි/ගල් මහ නගර සභාව. |

**ii.සෞඛ්‍ය** :- දුටුගැමුණු වසමේ සෞඛ්‍ය පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුත්තේ ඉහත පෙන්වා දුන් මාර්ග තුනෙහි නිවාසවල ජීවත් වන පුද්ගලයින්ගේය. සාමාන්‍ය ජීවන මට්ටමක ජීවත් වන මෙම පවුල් කිහිපය ම ඉතා කුඩා භූමි ප්‍රමාණයක කුඩා නිවාසවල ජීවත් වේ. වසන්ගත රෝග පැතිරීමේ දී මෙවැනි ස්ථානවල පහසුවෙන් ම බෝවීමේ හැකියාවක් ඇත. අධි නාගරික කලාපයක් වන මෙම ප්‍රදේශයේ පරිසරයට වාහනවලින් පිටවී යන කාබනික දුම සෞඛ්‍යයට අහිතකර අතර මාර්ග දෙපස සුදුසු රුක් රෝපණයක් සිදු කළ යුතුය.

| | |
|---|---|
| ගැටලුව | ✶ වාහන වලින් පිටවන කාබනික දුම.<br>✶ ගර්භණී මාතාවන්ගේ පෝෂණ වර්ධන ගැටලු.<br>✶ අඩු බර ළමුන්ගේ පෝෂණ වර්ධන ගැටලු.<br>✶ පෙර පාසල් ළමුන්ගේ පෝෂණ හා සෞඛ්‍ය ගැටලු.<br>✶ පාසල් ළමුන්ගේ පෝෂණ වර්ධන ගැටලු. |
| අරමුණ | නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් බිහිකිරීම හා දුටුගැමුණු වසමේ පෝෂණ ගැටලු අවම කිරීම. |
| උපාය මාර්ග | ✶ පවුල් සෞඛ්‍ය නිලධාරිතුමිය හරහා ඉහත කරුණු සම්බන්ධව වැඩසටහන් (දැනුවත් කිරීම්) ක්‍රියාත්මක කිරීම.<br>✶ පෙර පාසල් ගුරුවරුන් හරහා දරුවන් හට පෝෂණය ඇති වැදගත්කම පෙන්වා දීම.<br>✶ පෙර පාසල හරහා යහපත් සෞඛ්‍ය පුරුදු ප්‍රගුණ කරවීම.<br>✶ මහජන සෞඛ්‍ය පරීක්ෂක හරහා දැනුවත් කිරීම් ක්‍රියාවට නැංවීම.<br>✶ පාසල් ගුරුවරුන් හරහා පෝෂණයේ ගුණාංග පෙන්වාදීම.<br>✶ පරිසර හිතකාමී ඉන්ධන නිෂ්පාදනය. |

| | |
|---|---|
| ක්‍රියාකාරකම | ✶ සෑම නිවසකම භූමියට ගැළපෙන බෝග වගාව හා රුක් රෝපණය.<br>✶ පෝෂණ වැඩසටහන් ගර්භණී මාතාවන් හට පැවැත්වීම (ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා පවුල් සෞඛ්‍ය නිලධාරී.<br>✶ අඩු බර ළමුන් සඳහා ඊට සුදුසු ආහාර රටාවන් හඳුන්වා දීම හා ත්‍රිපෝෂ ලබාදීම.<br>✶ මාතෘ සායන සඳහා සහභාගි නොවන මවුවරු හා ළමුන් ඒ සඳහා යොමු කරවා ගැනීමට ආකර්ෂණීය හා දැනුමෙන් පෝෂණවූ වැඩසටහන් හඳුන්වා දීම.<br>✶ නිවැරදි පෝෂණයෙන් යුත් ආහාර රටාවක් හඳුන්වා දීම.<br>✶ පෝෂණ මල්ල ලබාදීම. (ගුණාත්මක නැවුම් පෝෂණයෙන් යුත් ආහාර ලබාදීමට අදාල ආයතන දැනුවත් කිරීම, ඒවාට ගොස් ලබාදෙන ලබන ආහාර ද්‍රව්‍ය පිළිබඳ සොයා බැලීම් කිරීම.<br>✶ අධික කලුදුම පිටවන වාහන ධාවනය නතර කිරීම සඳහා පොලීසිය මඟින් නව වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම. |
| කාලය | වසර පුරාවටම ක්‍රියාත්මක වේ. |
| වගකීම | ප්‍රධන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා<br>දේශීය වෛද්‍ය නිලධාරින්<br>පවුල් සෞඛ්‍ය නිලධාරිනිය<br>ශ්‍රී ලංකා පොලීසිය<br>ප්‍රා. ලේ. කාර්යාලය |

**iii.වැඩිහිටි ප්‍රජාව :-** දුටුගැමුණු වසමේ වයස අවු 60 ට වැඩි පුද්ගලයින් 1195 පමණ සිටින අතර ඔවුන්ගේ ජීවන රටාව හුදකලාවී ගත කිරීමට සිදුව ඇත. කාර්ය බහුල ජීවන රටාවක නියලෙන වසමේ තරුණ ප්‍රජාව සහසම්බන්ධය ගිලිහෙමින් පවතී.

| | |
|---|---|
| ගැටලුව | වැඩිහිටි ප්‍රජාව සමාජයේ හුදකලා වීමෙන් මානසික හා කායික ගැටලු. |
| අරමුණ | ✶ වැඩිහිටි ප්‍රජාව සක්‍රීය සමාජ ක්‍රියාකාරී මෙහෙවරක් කරන පිරිසක් බවට පත් කිරීම.<br>✶ නිරෝගි සම්පන්න වැඩිහිටි සමාජය ගොඩනැගීම. |
| උපාය මාර්ගය | වැඩිහිටියන් සවිබල කරණය සඳහා සමාජ ක්‍රියාකාරකම්වලට උපරිම දායක කරවීම. |
| ක්‍රියාකාරකම | ✶ සුහද හමු පැවැත්වීම.<br>✶ වැඩිහිටි සමිති පැවැත්වීම.<br>✶ ස්වෙච්ඡා සංවිධාන හරහා ඔවුන්ගේ සිතුම් පැතුම් හා සෞඛ්‍යට ගැළපෙන ක්‍රියාකාරී හා විනෝදාත්මක ශරීර සුවතා වැඩසටහන් හඳුන්වා දීම.<br>✶ වැඩිහිටි පිරිසට විනෝදය, සතුට, මනසේ සැහැල්ලුවට ගැළපෙන ගමන් කළ හැකි ස්ථාන නැරඹීමට රැගෙන යාම.<br>✶ නව තාක්ෂණය හරහා විවිධ විනෝදාත්මක වීඩියෝ ක්‍රීඩා හඳුන්වා දීම.<br>✶ ආකල්ප සංවර්ධන ප්‍රජා උපදේශන වැඩසටහන් හඳුන්වා දීම.<br>✶ වැඩිහිටි සමිතිය මඟින් වැඩිහිටියන් ඒකරාශී කර අත්කම් නිර්මාණ දැනුම ලබා දීම. (මල් කිණිති නිර්මාණය, බූල් මඟින් ගෙතුම් දැනුම) |
| කාලය | වර්ෂය පුරා |
| ප්‍රතිලාභීන් | 60 වැඩි ගැහැනු පිරිමි 5118 |
| වගකීම | ✶ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා සමාජ සේවා නිලධාරි<br>✶ ස්වෙච්ඡා සංවිධාන හරහා වැඩසටහන් ක්‍රියාත්මක කරවීම.<br>✶ සමාජ ආරක්ෂක අමාත්‍යාංශය (උපදේශන සහකාර නිලධාරි) |

**iv.මත්ද්‍රව්‍ය :-** දුටුගැමුණු වසමේ මත්ද්‍රව්‍ය ගැටලුව බැලූ බැල්මට දැකගත නොහැක. ඉතා නාගරික ප්‍රදේශයක් වන මෙම භූමි කලාපයේ ජීවත් වන ප්‍රජාව අතරින් බහුතරයක් ඉතා ධනවත් පිරිසය. ඒ අතරින් අපහසුතාවයෙන් ජීවත් වන පවුල් කීපයක් ජීවත් වේ. මෙම ජනතාව අතර මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය හිස ඔසවමින් පවතී. ජාතික පාසල් හා මහා විද්‍යාල වසමේ පිහිටා ඇති අතර ඒ ආශ්‍රිතව අපට ඇස නොගැසෙන මාර්ගයෙන් මෙම මත්ද්‍රව්‍ය ව්‍යාප්ත කරවීමේ වැඩසටහන් රහසිගතව සිදුවිය හැක.

| | |
|---|---|
| ගැටලුව | තරුණ හා ළමා පරපුර මත්ද්‍රව්‍ය රකුසාට බිලිවීම. |

| | |
|---|---|
| අරමුණ | ✶ තරුණ හා ළමා පරපුර මත්ද්‍රව්‍ය රකුසාගෙන් ගලවා ගැනීම.<br>✶ මත්ද්‍රව්‍ය භාවිතය අවම කරවීම. |
| උපාය මාර්ගය | මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම. |
| ක්‍රියාකාරකම | ✶ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.<br>✶ අත්පත්‍රිකා, දැන්වීම් මාර්ගයෙන් මත්ද්‍රව්‍ය භාවිතයේ භයානකකම පෙන්වා දීම.<br>✶ වීදි නාට්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩසටහන්.<br>✶ සාකච්ඡා, සම්මන්ත්‍රණ මගින් මත්ද්‍රව්‍ය භාවිතයේ බිහිසුණු බව පෙන්වාදීම.<br>✶ දහම් පාසල් හරහා දැනුවත් කිරීමේ වැඩසටහන්.<br>✶ උපදේශන ක්‍රියාවලිය සඳහා යොමු කිරීම.<br>✶ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් විධිමත් කිරීම. |
| කාලය | වර්ෂය මුළුල්ලේම |
| ප්‍රතිලාභීන් | 6000 පමණ |
| වගකීම | ✶ අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය හරහා (අන්තරාය ඖෂධ මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු කිරීමේ හා මත්ද්‍රව්‍යට අබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ නිලධාරි).<br>✶ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය (ජාතික උපදේශන මධ්‍යස්ථානය) උපදේශන සහකාර නිලධාරි. |

**V.සනීපාරක්ෂාව** :- සෞඛ්‍ය පුරුදුවල එක් පැතිකඩකි සනීපාරක්ෂාව. මෙම ගැටලුව දුටුගැමුණු වසමේ මාවත් හතරක පමණ සුළු වශයෙන් දකගත හැකිය. කුඩා ඉඩ ප්‍රමාණයක වාසස්ථාන ඉදිකර ඇති නිසා එකිනෙකට යාබඳ වීමෙන් වැසිකිළි කැසිකිළි භාවිතය ඉතා අපිළිවෙළක් ගනී. මෙමගින් සෞඛ්‍ය ගැටලු හටගත හැකිය.

| | |
|---|---|
| ගැටලුව | සනීපාරක්ෂක පහසුකම් නොමැති කම. |
| අරමුණ | ✶ විධිමත් සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම.<br>✶ විධිමත් සනීපාරක්ෂක පුරුදු හඳුන්වාදීම. |
| උපාය මාර්ගය | ✶ අවිධිමත් ඉදිකිරීම් නිසා සනීපාරක්ෂක පහසුකම් නොමැති වීමත් විධිමත් ඉදිකිරීම් නියාමනය කිරීම.<br>✶ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි, දෙහි/ගල් මහ නගරසභා තාක්ෂණ නිලධාරි, ප්‍රා. ලේ. කා. තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් හා අදහස් ක්‍රියාවට නැංවීම. |
| ක්‍රියාකාරකම | ✶ වැසිකිළි නොමැති නිවාසවලට වැසිකිළි ඉදිකර ගැනීමට මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර කිරීම.<br>✶ ආබාධිත පුද්ගලයින් සඳහා උපකරණ හා ආබාධිත පුද්ගලයන් හට සරිලන සේ වැසිකිළි ඉදිකිරීමට උපදෙස් හා මූල්‍යමය ආධාර ලබාදීම.<br>✶ ගොඩනැගිලි ඉදිකිරීමේ දී සෞඛ්‍ය නීති රීති පිළිපදිමින් ඉදිකිරීම් කටයුතු කිරීමට දැනුවත් කිරීම. |

**Vi.ආගමික ස්ථාන** :- දුටුගැමුණු වසමේ සියලු ජාතීන් ජීවත් වන අතර ඔවුන්ගේ සංස්කෘතිය අනුව වත්පිළිවෙත් ඉටුකර ගැනීම සඳහා ආගමික ස්ථාන පිහිටා ඇත. පන්සල්, කතෝලික පල්ලි, කෝවිල් මෙම වසමේ ස්ථාපිත වී ඇත.

| | |
|---|---|
| ගැටලුව | ✶ වන්දනාමාන කිරීමට පැමිණෙන ගම් වැසියාට ජල පහසුකම් නොමැතිකම.<br>✶ සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම.<br>✶ සනීපාරක්ෂක භූමියේ නිසි ක්‍රමවේද නොතිබීම. |
| අරමුණ | ආගමික කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා පරිසරය සකසා දීම. |
| උපාය මාර්ගය | ✶ දායක සභාව හරහා ඉහත කරුණු සම්බන්ධව පියවර ගැනීම.<br>✶ අදාළ අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම.<br>✶ දානපති ප්‍රභූ උපකාර උපදෙස් ලබා ගැනීම. |
| ක්‍රියාකාරකම | **පන්සල්** |

| | |
|---|---|
| | ✶ සිරි ධම්මාරාමයේ ජල නල පද්ධතිය අලුත්වැඩියා කිරීම.<br>✶ සිරි ධම්මාරාම විහාරයේ ස්වාමීන් වහන්සේලාගේ සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළි 03 හා නාන කාමරයක් ඉදිකිරීම.<br>✶ සිරි ධම්මාරාම විහාරයට ලැබී ඇති ඉන්ටලොග් ගල් දහම් පාසැල් ශාලාව ඉදිරිපිට මිදුලේ ඇතිරීම.<br>✶ සිරි ධම්මාරාම විහාරයේ පවතින කැසිකිළි අපද්‍රව්‍ය එක්වන වළට (settic) අලුතින් වළක් ඉදිකිරීම.<br>**චින්තාරාමය**<br>✶ බෝ අංකුරය රෝපණය සඳහා ෆයිබර් පාත්තරයක් ඉදිකිරීම. (කොන්ක්‍රීට් වළලු මත කණුවක් ඉදිකර ඇත)<br>✶ බුදු මැදුරේ ඉහළ මාලයේ එක් පැත්තක බිත්ති බැඳ කණු උස්සා වහල ගැසීම.<br>✶ බුදු මැදුර පිහිටි බිමෙහි ටයිල් ඇල්ලීම (වර්ග අඩි 400 පමණ)<br><br>**ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය**<br>ක්‍රිස්තියානි පෙරමාදු දේවස්ථානයේ වැසි ජලය එක් වී ගොඩනැගිලි යටවී යාම වැළැක්වීම සඳහා ඉදිරිපස කාණුවට, එම ජලය ගැඹුරු කාණුවක් හරහා රැගෙන ඒම. |
| වගකීම | ✶ බුද්ධශාසන අමාත්‍යාංශය<br>✶ සංස්කෘතික දෙපාර්තමේන්තුව<br>✶ ප්‍රා. ලේ. කාර්යාලය |

vii.**අධ්‍යාපනය** :- ඉතා නාගරික ප්‍රදේශයක් වන මෙම වසම තුළ අධ්‍යාපනය ලබන්නාවූ සැමට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ඉගනුම ලැබීමට සියලු පහසුකම් වලින් යුත් ප්‍රදේශයකි. ළදරු පාසලේ සිට උසස් අධ්‍යාපනය දක්වා පහසුකම් පිහිටා ඇති මෙම වසමේ පාසල් ගත්කල අනුලා විද්‍යාලය, අනුලා ප්‍රාථමිකය, සෙන් ජෝසප් බාලිකා විද්‍යාලය, දෙමළ මහා විද්‍යාලය රජයේ පාසල් ද පෞද්ගලික අංශයේ විද්‍යාල ද ඇත. (ලයිසියම් විද්‍යාලය, කලම්බු සවුත් විද්‍යාලය)
ඉහත රජයේ විද්‍යාල ගත්කල අනුලා විද්‍යාලයේ කාර්යාල පරිශ්‍රය පිහිටා ඇත්තේ දෙහිවල කොට්ඨාශයටය. ප්‍රාථමික විද්‍යාලයේ ද කොටසක් දෙහිවලට අත්වනසේ පිහිටා ඇත. අනෙකුත් පාසල් හා පෞද්ගලික විශ්ව විද්‍යාල ද මෙම වසම තුළ දැකගත හැකිය.

| | |
|---|---|
| ගැටලුව | ✶ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා ලබාදෙන අධ්‍යාපනය පිළිබඳ තොරතුරු ප්‍රචාරණයේ දුර්වල කම.<br>✶ පාසල් අධ්‍යාපනය මඟහැරුණු හා අඩු අධ්‍යාපනය ලබන පිරිස සඳහා වෘත්තීය කුසලතාව අවම වීම.<br>✶ දරුවන් හට අධ්‍යාපන කටයුතු කරගෙන යාමේදී ඇතිවන බාධා.<br>✶ අනාරක්ෂිත ගොඩනැගිලි මඟින් ඇතිවන හානි.<br>✶ ක්‍රීඩා කටයුතු සඳහා නිසි පරිසරයක් නොවීම. |
| අරමුණ | ✶ තරුණ ප්‍රජාවගේ වෘත්තීය මට්ටම ඉහල නැංවීම.<br>✶ පාසල් දරුවන් හට පහසුනම් සහිත හොඳ අධ්‍යාපනයක් ලබාගැනීමේ පරිසරයක් ගොඩනැගීම.<br>✶ දරුවන්ගේ ආරක්ෂාව ප්‍රමුඛ ගත කිරීම.<br>✶ නිරෝගිමත් සෞඛ්‍ය තත්වයක් ලබා දීම.<br>✶ රටට වැඩදායී අනාගත පරපුරක් බිහි කිරීම.<br>✶ විශිෂ්ට පුරවැසියෙක් සමාජගත කිරීම. |
| උපාය මාර්ගය | ✶ අධ්‍යාපන අමාත්‍යාංශය, කලාප අධ්‍යාපන සමිති කාර්යාලය එක්ව සැලැස්මක් සැකසීම.<br>✶ විදුහල්පති හා ගුරු බවතුන් පාසලෙහි නිසි ක්‍රමවේදයක් සැකසීම.<br>✶ පාසල් සංවර්ධන සමිතිය මඟින් පාසලෙහි චංචල නිශ්චල දේපළ පවත්වා ගැනීමට සුදුසු සැලැස්මක් නිර්මාණය කිරීම.<br>✶ මුදල් අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම.<br>✶ අදිශිෂ්‍ය සංගමයේ අදහස් හා යෝජනා ගැනීම.<br>✶ ප්‍රා. දේ. කා./ දෙහි/ගල් මහ නගර සභාව එක්ව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. |

| | |
|---|---|
| ක්‍රියාකාරකම් | ✶ පාසල් හැර ගිය ළමුන් වෘත්තීය පුහුණු අධ්‍යාපනයට පෙලඹවීම.<br>✶ දෙහි/ගල් මහනගර සභාවේ මහජන පුස්තකාලයේ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ළමුන් යොමු කිරීම.<br>නුගේගොඩ දෙමළ විද්‍යාලය<br>✶ ප්‍රධාන ශාලාවේ දොරවල් 6 ක් සවි කිරීම.<br>✶ ප්‍රධාන ගොඩනැගිල්ලේ පොළව ටයිල් ඇල්ලීම.<br>✶ ප්‍රධාන ශාලාවේ ජනෙල් (ස්ලයිඩින්) 08 ක් සවි කිරීම.<br>සෙන් ජොසප් බාලිකා විද්‍යාලය<br>✶ 8-9 වසර ගොඩනැගිල්ල ව්‍යුහාත්මකව නවීකරණය කිරීම. (කණුවල කම්බි මතුවී කැලි කැඩී වැටේ).<br>✶ ජල කුලුනක් ඉදිකිරීම.<br>✶ උ/පෙළ විද්‍යා අංශයේ ගොඩනැගිල්ලේ සිවිලිම ගැසීම.<br>✶ නෙට්බෝල් ක්‍රීඩා කිරීම සඳහා වැලි අතුරා පිටිය සකස් කිරීම හා වැටියක් බැඳ ජලය බැස යාමට කාණුවක් ඉදිකිරීම.<br>✶ ක්‍රීඩා කාමරයේ වහලය අලුත්වැඩියා කිරීම.<br>✶ 11 වසර ගොඩනැගිල්ල පිටුපස වැසිකිළි 04 සහ නාන කාමරයක් ඉදිකිරීම.<br>✶ ප්‍රාථමික අංශය සඳහා (ගුරු) වැසිකිළි 02 සහ ජල කරාම 03 සහිත සින්ක් සවි කිරීම.<br>අනුලා විද්‍යාලය<br>✶ පැති ගේට්ටුව සඳහා මුරකුටියක් ඉදිකිරීම.<br>✶ පැති ගේට්ටුව අසල වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම.<br>✶ ප්‍රාථමික අංශයේ ගිලන් කාමරය සැකසීම.<br>✶ ප්‍රාථමික අංශයේ ඉදිරිපස තාප්පය අලුත්වැඩියා කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ ප්‍රමාණවත් ගුරු මණ්ඩලයක් පවත්වා ගැනීම.<br>✶ ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපන, තාක්ෂණ, ආගමික, සංස්කෘතික, කලා, නව තාක්ෂණය යන අංග සම්පූර්ණ වැඩ පිළිවෙළක් පාසල් දරුවාට හඳුන්වා දීම.<br>✶ මැහුම්, ගෙතුම් ආදී සහජ දක්ෂකම් ඇති ළමුන් සඳහා පාඨමාලා ආගමික මධ්‍යස්ථානවල නොමිලේ ඉගැන්වීම. |
| කාලය | වර්ෂය පුරා |
| වගකීම | ✶ අධ්‍යාපන අමාත්‍යාංශය<br>✶ කලාප අධ්‍යාපන කාර්යාලය<br>✶ මුදල් අමාත්‍යාංශය<br>✶ දෙහි/ගල් මහනගර සභාව<br>✶ ප්‍රා. ඉංජිනේරු කාර්යාලය<br>✶ ප්‍රා. ලේ. කාර්යාලය |

viii.ළමා අපයෝජනය

| | |
|---|---|
| ගැටලුව | ඉලක්කගත හා වර්තාගත නොවන අපයෝජනයට ලක්වන ළමුන් හඳුන්වාදීම. |
| අරමුණ | අපයෝජන හා හිංසන ක්‍රියා නොවීමට වැඩපිළිවෙළක් සකස් කිරීම. |
| උපාය මාර්ගය | ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා ප්‍රජා සංවිධානවල නියෝජිතයන් සමග සැලැස්මක් සැකසීම. |
| ක්‍රියාකාරකම | ✶ පාසල්වල දෙමාපිය රැස්වීම් හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.<br>✶ පාසල තුළ දී දරුවන්හට ළමා අපයෝජනය පිළිබඳ පැහැදිලිකර දී එවැනි දෙයින් වැළකීමට උපදෙස් දීම.<br>✶ ළමුන් හඳුනාගැනීමට පසුවිපරම් කිරීම.<br>✶ පෙර පාසල් හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම.<br>✶ ජනමාධ්‍ය, වෙළඳ දැන්වීම් මගින් දරුවන් දැනුවත් කිරීම. |
| කාලය | වර්ෂය පුරා |
| වගකීම | ✶ ළමා හා කාන්තා කාර්යාංශය<br>✶ ශ්‍රී ලංකා පොලිසිය<br>✶ ප්‍රා. ලේ. කා.<br>✶ මහජන සෞඛ්‍ය පරීක්ෂක |

**05.නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම.**

දුටුගැමුණු වසම තුළ පාසල් හැර ගිය දරුවන් හා තම හැකියා දැනුම හා සහජ කුසලතා සහිත දුවා දරුවන් උදෙසා ඔවුන්ගේ අනාගතය ගුණාත්මක සංවර්ධනයක් කරා රැගෙන යාම සඳහා නිපුණතා සංවර්ධනය හා හැකියා වර්ධනය උදෙසා කටයුතු කළ යුතුයි.

| | |
|---|---|
| ගැටලුව | ✶ පාසල් අධ්‍යාපනය මගහැරුණු දරුවන් හා අඩු අධ්‍යාපන ලැබූවන්හට වෘත්තීය කුසලතා ඔප් නැංවීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් නොවීම.<br>✶ පාසල් නොයන තරුණ තැරණියන් තුළ වෘත්තීය කුසලතා අවම වීම හේතුවෙන් විරැකියාවෙන් පෙළෙන තරුණ පරපුර විශාල වීම.<br>✶ ණය හා ආයෝජන පුහුණුව අවම වීම.<br>✶ විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් කරගන්නා පිරිස අවම වීම හේතුවෙන් අනෙකුත් දරුවන්ට උසස් අධ්‍යාපනය අහිමි වීම. |
| අරමුණ | ✶ තරුණ තරුණියන්ගේ වෘත්තීය නිපුණතාව ඉහළ නැංවීම.<br>✶ නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීමෙන් රැකියා අවස්ථා ලබා දීම. |
| උපාය මාර්ගය | ✶ වෘත්තීය පුහුණුවට තරුණ පිරිස යොමු කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ වෘත්තීය පුහුණු ආයතන කරා යොමු කිරීම.<br>✶ උසස් අධ්‍යාපනය මග හැරුණු දරුවන් උදෙසා Saegis Campus එක හරහා සහනදායී ක්‍රමයට අඩු ආදායම් දරුවන් සඳහා උසස් අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව සලසා දීම.<br>✶ මැහුම් උපදේශන පාඨමාලා වසම තුළ හඳුන්වා දීම. |
| වගකීම | ✶ නිපුණතා සංවර්ධන නිලධාරි<br>✶ මානව සම්පත් නිලධාරි<br>✶ විද්‍යා තාක්ෂණ නිලධාරි<br>✶ වනිතා කටයුතු නිලධාරි |

**06.ජීවනෝපාය ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබලකරණ සැලැස්ම.**

නාගරික පරිසර කලාපයක පිහිටි දුටුගැමුණු ග්‍රා. නි. කොට්ඨාශය තුළ ජීවනෝපාය උදෙසා ස්වයං රැකියාවල නියුතු පිරිස ගත්කල ඉතා අල්පය. මෙහි ඉදිආප්ප තැම්බීම, බත් පැකට් කර විකිණීම, කෙටිකෑම සාදා අලවි කිරීම වැනි කුඩා ව්‍යාපාරවල නියුතු පිරිස් කිහිප දෙනෙක් සොයාගත හැකිය. මෙම පිරිසගේ ජීවනෝපාය නගා සිටුවීම උදෙසා අතහිත දීමත් සිදු විය යුතුය. කාන්තාවන් වැඩි පිරිසක් සමෘද්ධි ලාභීන් වන අතර එහි කාන්තා පිරිස සඳහා නගා සිටුවීමේ වැඩසටහන් හඳුන්වා දිය යුතුය.

| | |
|---|---|
| ගැටලුව | ✶ ස්ථිර අදායම් මාර්ගයක් නොමැතිකම මූල්‍යමය අපහසුතාවට පත්වීම දිළිඳුකකම ඇතිවීම.<br>✶ නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවම වීම.<br>✶ තරුණ පරපුරට බලපා ඇති රැකියා ගැටලුව.<br>✶ උසස් අධ්‍යාපනයට පිවිසීමට ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවීම. |
| අරමුණ | ✶ ආදායම් මට්ටම ඉහල නැංවීම.<br>✶ පුළුල්ව නිෂ්පාදන වෙළඳපොළ ඇති කිරීම හා ජීවන තත්වය නගා සිටුවීම.<br>✶ ගුණාත්මක පෝෂණීය නිෂ්පාදනයන් හඳුන්වා දීම.<br>✶ රටට වැඩදායි තරුණ පිරිසක් බිහි කිරීම.<br>✶ දිළිඳුකම පිටුදැකීම.<br>✶ නව තාක්‍ෂණයට ගැලපෙන රැකියා බිහි කිරීම. |
| උපාය මාර්ග | ✶ තරගකාරී නිෂ්පාදන රටාවක් වෙළඳපොළට හඳුන්වා දීම.<br>✶ විදාතා නිලධාරී හරහා නිෂ්පාදන දැනුම ලබාදීම.<br>✶ මැහුම් උපදේශන නිලධාරී හරහා මැහුම් කර්මාන්තයේ දැනුම ලබාදීම.(සාරි ජැකට්, බෙඩ් ෂීට්, නයිට්ඩ්‍රෙස්)<br>✶ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා නව රැකියා වෙළඳපොළට ගැලපෙන දැනුම ලබාදීමට ක්‍රමවේදයක් සැකසීම. |
| ක්‍රියාකාරකම | ✶ තරගකාරී වෙළඳපළට සරිලන ලෙස නිෂ්පාදන ආකර්ෂණීය හා ගුණාත්මකව හඳුන්වා දීම.<br>✶ නිෂ්පාදන ඇසුරුම් ආකර්ෂණීය පෙනුමක්, හැඩයක් හා වර්ණ ගැන්වීම.<br>✶ විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රචාරණය කිරීම.<br>✶ ව්‍යවසාය හා කුඩා ව්‍යාපාර නිලධාරී හරහා කොටස් වශයෙන් ණය ලබාදීම.<br>✶ වෙළඳපොළ අවස්ථා සපයාදීම.<br>✶ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධතා හඳුන්වා දීම.<br>✶ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා ලබාදීම. |
| කාලය | වර්ෂයක් පාසා |
| ප්‍රතිලාභීන් | 300 |
| වගකීම | ✶ මානව සම්පත් සංවර්ධන නිලධාරී.<br>✶ විදාතා තාක්ෂණ නිලධාරී.<br>✶ වනිතා සංවර්ධන නිලධාරී.<br>✶ කුඩා ව්‍යාපාර නිලධාරී.<br>✶ සංවර්ධන නිලධාරී.<br>✶ ව්‍යවසාය නිලධාරී. |

දුටුගැමුණු වසම සමෘද්ධි පොරොත්තු ලේඛනය

| | නම | ලිපිනය | ජා. හැ. අංකය | සමාජික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | W.K.K සිල්වා | 166, දුටුගැමුණු වීදිය | 685693470v | 02 |
| 2 | A විජය කුමාරි | 21/5, ඉන්ද්‍රා මාවත | 655925198v | |
| 3 | R.A රණවීර ෆොන්සේකා | 21/3, ඉන්ද්‍රා මාවත | 682881313v | 02 |
| 4 | K.A රුමේෂ් සිල්වා | ඉන්ද්‍රා මාවත | 197510200384 | |
| 5 | J.K.D අංජලි ප්‍රේමතිලක | 25/5, සිරිගල් මාවත | 828650580v | |
| 6 | H.P.H නිශාන්ති | 31, ඇන්ඩර්සන් පාර | 808001683v | 04 |
| 7 | K.V සුදර්මා | 15/2B, මුදලි මාවත | 677001518v | |
| 8 | W. ඉන්ද්‍රා මාලනි | 9/4, මුදලි මාවත | 608331590v | |
| 9 | H.P පද්මලතා | 35, ඇන්ඩර්සන් පාර | 665263304v | 02 |
| 10 | K. සෙල්වරත්නම් | 15A\1\1, සිරිගල් මාවත | 196859900652 | 05 |

**07.පරිසර කලමණාකරණය**

මෙහිදී ඉතා වැදගත් කරුණකි කැළිකසළ. මෙම ගැටලුව කොළඹ දිස්ත්‍රික්කයේ බහුලව දකගත හැක. නිසි ක්‍රමවේද නොතිබීම නිසා පාරිසරික ගැටලු රැසකට මුහුණ දීමට සිදුවී ඇත. දුටුගැමුණු වසම ද ඉතා නාගරික පරිසරයක පිහිටීමත්, ජනගහනය අධික වීමත් පාරිසරික ගැටලු රැසකට මූලික හේතුවකි. මේ සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පහතින් සලකා බලමු.

| | |
|---|---|
| ගැටලුව | ✶ අවිධිමත් කැළි කසළ බැහැර කිරීම.<br>✶ කසළ බැහැර කිරීමේ ස්ථානයක් නොතිබීම. |
| අරමුණ | ✶ අපද්‍රව්‍ය හා කැළිකසළ කලමනාකරණය.<br>✶ දුගඳ හමන පරිසර කලාප සමාජයෙන් ඉවත් කිරීම.<br>✶ සුන්දර ඇසට ප්‍රිය පරිසරයක් මහජනතාවට ලබාදීම. |
| උපාය මාර්ග | ✶ පරිසර හිතකාමී කැළිකසළ බැහැර කිරීමේ උපාය මාර්ගයක් ඇති කිරීම.<br>✶ දෙහි/ගල් මහනගර සභාව හා මහජන නියෝජිතයින් හා සාකච්ඡා කර කසළ බැහැර කිරීමේ හා එක් රැස් කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.<br>✶ මහජනතාවට කසළ බැහැර කිරීමේදී මුදල් ඉපයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම. |
| ක්‍රියාකාරකම් | ✶ වර්ගීකරණය කර කැළිකසළ ලබාදීම.<br>✶ නැවත පරිහරණය කළහැකි අපද්‍රව්‍ය මිලදී ගන්නා ආයතන හා සම්බන්ධ කිරීම.<br>✶ කුණු ප්‍රමිතිගත කර ලබාදී ගෙහිමියාට මුදලක් ලබාදීම.<br>✶ නිවසේම කොම්පෝස් පොහොර නිපදවා ගැනීමේ බඳුන් ලබාදීම.<br>✶ නගරය තුළ කසළ බඳුන් ස්ථාපිත කිරීම.<br>✶ නගරයෙහි මන්මාවත් විධිමත් වැඩ පිළිවෙළකට පවිත්‍ර කිරීමේ සැලැස්මක් හඳුන්වාදීම. |
| කාලය | වර්ෂය පුරා |
| ප්‍රතිලාභීන් | 6045 |
| වගකීම | ✶ දෙහි/ගල් මහනගර සභාව.<br>✶ පරිසර නිලධාරි.<br>✶ මහජන සෞඛ්‍ය පරීක්ෂක.<br>✶ ප්‍රජා පොලිස් ඒකකය.<br>✶ ස්වේච්ඡා සංවිධාන.<br>✶ ගම්වාසීන්. |
| ගැටලුව | නියමිත පරිදි කසළ ප්‍රවාහනය නොකිරීම |
| අරමුණ | විධිමත් පරිදි කසළ ප්‍රවාහනය කිරීමට වැඩසටහනක් හඳුන්වා දීම. |
| උපාය මාර්ග | ✶ පවිත්‍රතා අංශයේ නිලධාරින් සමඟ එක්ව තිරසර වැඩපිළිවෙළක් සකස් කිරීම |
| ක්‍රියාකාරකම | ✶ මහජනතාවට කසළ ලබාගන්නා දින වේලාව ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීම.<br>✶ කසළ ලබාදිය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීම. |
| කාලය | වර්ෂය පුරා. |
| ප්‍රතිලාභීන් | 6045 |
| වගකීම | ✶ දෙහි/ගල් මහනගර සභාව.<br>✶ වසමේ මහජනතාව. |

i.ඩෙංගු උවදුර :- ඉදිකිරීම් සෑම දිනකම සිදුවන ප්‍රදේශයක් වන දුටුගැමුණු වසම තුළ ඩෙංගු උවදුර මතුවීම විටින් විට දැකගත හැක. ඉදිකිරීම මග නවතා දැමීම, කොන්ත්‍රාත් කරුවන් නියමිත ක්‍රමවේද අනුගමනය නොකිරීම ඩෙංගු වර්ධනයට එක් හේතුවකි. තවද තම නිවෙස අවට අපවිත්‍ර ව තබාගැනීම ඩෙංගු රෝගය හිස එසවීමට ප්‍රධාන කරුණු වේ.

| | |
|---|---|
| ගැටලුව | ✶ දුටුගැමුණු වසම තුළ ඩෙංගු උවදුර වර්ධනය වීම. |
| අරමුණ | ඩෙංගු ව්‍යාප්තිය අවම කිරීම. |
| උපාය මාර්ග | ✶ සෞඛ්‍ය අමාත්‍යාංශය හා පලාත් සභාව එක්ව විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාවට නැන්වීම.<br>✶ සෞඛ්‍ය වෛද්‍ය නලධාරි කාර්යාලය මඟින් ඵලදායි වැඩසටහන් ක්‍රියාවට නැන්වීම.<br>✶ මහජනතාවට ඩෙංගු අවදානම මාධ්‍ය හරහා ඉදිරිපත් කිරීම. |
| ක්‍රියාකාරකම | ✶ ගෙන් ගෙට ගොස් ඩෙංගු උවදුර පිළිබඳ දැනුවත් කිරීම.<br>✶ වසමේ වීදි හා මාර්ග සම්බන්ධ කර ප්‍රජා නායකයින්ගේ ද සහය ඇතිව වීදි කමිටු ඇති කිරීම.<br>✶ අත්පත්‍රිකා පෝස්ටර් මඟින් ප්‍රචාරණය.<br>✶ නිවාස හා ඉදිකිරීම් සථාන පරීක්ෂාව.<br>✶ ඩෙංගු අවදානම ඇති ස්ථාන වල දූමායනය කිරීම.<br>✶ ප්ලාස්ටික්, බෝතල්, යකඩ, වීදුරු ආදී ලට්ට ලොට්ට මිලදී ගන්නා ආයතන සම්බන්ධීකරණය කරදීම.<br>✶ වසමේ කාණු පද්ධතිය පවිත්‍ර කිරීම. |
| කාලය | වර්ෂය පුරා |
| වගකීම | ✶ දෙහිවල ගල්කිස්ස නගර සභාව.<br>✶ පලාත් සභාව හා මධ්‍යම රජය.<br>✶ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය.<br>✶ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.<br>✶ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

**08.කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම.**

537/A දුටුගැමුණු වසම තුළ ජීවත්වන බෝහෝ පිරිස් ඉතා අඩු භූමි ප්‍රමාණයක් හිමි පුද්ගලයින්ය. එනමුත් පවත්නාවූ ආර්ථික අර්බුදයට හා වර්ධනය වෙමින් පවතින ලෙඩරෝග වලට වැට කඩුල්ලකි, කෘෂි කාර්මාන්තයට සෑම නිවැසියෙක්ම යොමු වීම. තම ගෙවත්තේ බඳුනක හෝ පාත්තියක ගොටුකොළ, මුකුණුවැන්න, කංකුං, කරපිංච, මිරිස්, බණ්ඩක්කා, බටු, ඉඟුරු ආදී කුඩා පැළ රෝපණය කරගත හැක.

මෙමගින් තම නිවසේ පරිභෝජනය සඳහා ගැනෙන එදිනෙදා බෝග නිවසින්ම සපයා ගත හැක. එමගින් ආර්ථික වාසි හා ලෙඩරෝග වලින ද ආරක්ෂා විය හැක. බෝ නොවන රෝග හා බෝවන රෝග රට තුළ හිස ඔසවනුයේ මෙම ආහාර බව නොරහසකි. මෙම වියසන වලින් බේරීමට සෑම නිවසකම වගා කිරීම යහපත් දැක්මකි. මෙසේ රටේ සෑම නිවසකම හැකි පමණ වගා කිරීමෙන් රටේ ආර්ථිකයට ද පිටුවහලකි. මේ වෙනුවෙන් රජය විසින් නොයෙකුත් වැඩ සටහන් මහජනතාවට ඉදිරිපත් කර ඇත.

| | |
|---|---|
| ගැටලුව | ✶ ගෙවතු වගාව සඳහා හොඳ බීජ වර්ග නොමැති වීම.<br>✶ නාගරික ප්‍රජාවගේ ගෙවතු වගාව පිළිබඳ අඩු දැනුම.<br>✶ කෘමීන්ගෙන් වන හානි වලක්වා ගැනීමේ ක්‍රමවේද පිළිබඳ අනවබෝධය.<br>✶ පස් හා පොහොර ලබා ගැනීමට ඇති අපහසුතා. |
| අරමුණ | ✶ නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම.<br>✶ තට්ටු නිවාස වල ජනතාවට ගැළපෙන වගා ක්‍රම හඳුන්වාදීම.<br>✶ නිවසින් කාබනික බෝග නිපදවා ගැනීමට උනන්දු කිරීම. |
| උපාය මාර්ග | ✶ අවම භූමි ප්‍රමාණයකින් වැඩි ඵලදායිතාවක් සහිත වගා ක්‍රමයක් හා බීජ වර්ග හඳුන්වා දීම.<br>✶ වගා සම්බන්ධ නිලධාරින් හා ආයතන එක්ව තම කෘෂිකාර්මික වැඩපිළිවෙළක් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම | ✶ වැඩි ඵලදායිතාවක් ඇති දෙමුහුන් බීජ හඳුන්වා දීම.<br>✶ කෘෂි සංවර්ධන හා කෘෂි උපදේශක නිලධාරින් හරහා කෘෂි ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම.<br>✶ තිරස් වගාව හඳුන්වා දීම. (වර්ටිකල් වගාව)<br>✶ ගෙවතු වගා දැනුම, රෝග නිවාරණ උපක්‍රම, කාබනික පොහොර භාවිතය හා වගා නඩත්තු කිරීමේ ශිල්ප ක්‍රම හඳුන්වා දීම.<br>✶ ඒ ඒ භූමියට ගැළපෙන බීජ හා පැළැටි හඳුන්වා දීම.<br>✶ බඳුන් වගාව, පීලිවල වගාව, උඩුමහලේ වගාව පිළිබඳ දැනුම ලබාදීම. |
| කාලය | වර්ෂය පුරා |
| ප්‍රතිලාභීන් | 537/A වසමේ ප්‍රජාව. |
| වගකීම | ✶ කෘෂිකර්ම අමාත්‍යාංශය.<br>✶ කෘෂි නිෂ්පාදන පර්යේෂණ සහකාර නිලධාරි.<br>✶ පර්යේෂණ සහකාර නිලධාරි.<br>✶ ගොවිජන නිලධාරි.<br>✶ ග්‍රාම නිලධාරි.<br>✶ සංවර්ධන නිලධාරි.<br>✶ සමෘද්ධි නිලධාරි.<br>✶ කෘෂිකර්ම නිලධාරි. |